# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2023
2025 සැප්තැම්බර් / ඔක්තෝබර්

## මානවශාස්ත්‍ර පීඨය

## සිංහල

සිංහල භාෂා සම්ප්‍රදාය හා කලා ශිල්ප

**SINH 28224**

සෑම කොටසකින්ම අයත් වන සේ ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

### I කොටස

01. 'සිංහල භාෂාව ඉන්දු-ආර්ය සම්භවයක් සහිතය'. මේ මතය නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න.

02. සිංහල භාෂාවේ සම්භවය, ද්‍රාවිඩ භාෂා මූලික කොට ඇති බවට දැක්විය හැකි සාධක පිළිබඳ විචාරාත්මක විමසීමක් කරන්න.

03. ගයිගර් පඬිවරයා ඇතුළු භාෂා තත්ත්වඥයින්ගේ භාෂාමය යුග වර්ගීකරණය භාෂාධ්‍යයනයකදී වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න.

04. පහත සඳහන් මාතෘකා අතරින් එකක් පිළිබඳ ප්‍රාමාණික විග්‍රහයක් කරන්න.

    (i) සිංහල ප්‍රාකෘත අවධියේ භාෂා ලක්ෂණ
    (ii) මධ්‍යතන සිංහල අවධියේ සිදු වූ භාෂා විපර්යාසය
    (iii) නූතන සිංහල භාෂාව කෙරෙහි පතිත වූ යුරෝපීය භාෂා බලපෑම

### II කොටස

05. 'සිදත්සඟරා කතුවරයා විසින් ඉදිරිපත් කරන ලද අක්ෂරමාලාව, තත්කාලීන අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීමකි'. විමසන්න.

06. සිදත්සඟරාවෙන් ඉගැන්වෙන සන්ධි පිළිබඳ ප්‍රාමාණික විග්‍රහයක් කරන්න.

07. 'ක්‍රියාව' යනු කුමක්දැයි හඳුන්වා සිදතේ සඳහන් වන ත්‍රෛකාලික ක්‍රියා භාවිතය පැහැදිලි කරන්න.

## III කොටස

08. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානව කෘති මෙරට කලා ඉතිහාසයේ විශේෂ නිර්මාණ සම්ප්‍රදායයක් හෙළි කරන ආකාරය විමර්ශනය කරන්න.

**නැතහොත්**

ලක්දිව බුද්ධ ප්‍රතිමාවේ කලාත්මක විකාසනය සිදු වූ ආකාරය පැහැදිලි කරන්න.

09. 'සීගිරි චිත්‍ර වනාහි මෙරට දීර්ඝ කාලයක් තිස්සේ ව්‍යාප්ත වෙමින් පැවති චිත්‍ර කලාවක උච්චාවස්ථාවකි'. නිදසුන් සපයමින් විභාග කරන්න.

**නැතහොත්**

ආගමික කරුණු සන්නිවේදනයෙහි ලා මහනුවර යුගයේ චිත්‍ර ශිල්පීන් දැක්වූ නැඹුරුව, වස්තුවිෂය හා චිත්‍ර සම්ප්‍රදායයේ ව්‍යාප්තිය කෙරෙහි විශේෂාවධානයෙන් යුක්තව සාකච්ඡා කරන්න.

10. 18-19 වන සියවස්වල ලංකාවේ ඉදිකිරීම් ශිල්පය කෙරෙහි බලපෑ බටහිර ගෘහනිර්මාණ කලාව පිළිබඳ විමසීමක් කරන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගින්)

**************************